# සංඥාර්ථවේදය පිළිබඳ න්‍යායාත්මක විග්‍රහයක්

රොෂාන් ලක්නිල්

The objective of this study is to focus on the theoretical aspects of semiotics. Semiotics is the study of signs which gives a major contribution in order to make each and every cultural product a success. Since the 1960s, it has been developing with the relationship of Structuralism. In this study I have discussed prominent personalities and their interpretations on semiotics.

'සංඥා-අර්ථ-වේදය' පිළිබඳ ව සාකච්ඡා කිරීමට පළමුව 'සංඥාවක්' යනු කුමක් දැ යි විග්‍රහ කර බැලීම වටී. 'යම් ප්‍රපංචයකට තමා ගැන හැර වෙනත් ප්‍රපංචයක් පිළිබඳ අදහසක් ප්‍රකාශ කළ හැකි නම් එය සංඥාවකි.' අර්ථ නිෂ්පත්තිය, සංඥාවන් පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන ශාස්ත්‍රය සංඥාර්ථවේදය යනුවෙන් හැඳින්වේ.'

පසුගිය දශක කිහිපය තුළ දී මුළුමහත් ලෝකය ම සාක්ෂරතාව හා දැන උගත්කම අතින් නව අදියරකට පය තැබූ බව පිළිගත යුතු සත්‍යයකි. සාක්ෂරතාව තුළ අකුරු ලිවීමට හා කියවීමට ඇති හැකියාව ලෙස සාම්ප්‍රදායික ව ඉදිරිපත් කරන ලද නිර්වචනය ද චිත්‍රපටය, නූතන චිත්‍ර කලාව, පරිගණකය හා රූපවාහිනිය නිසා වෙනස් වී ඇති අතර දැනීම හා නොදැනීම අතර වෙනස තක්සේරු කිරීමේ දී දෘශ්‍ය සාක්ෂරතාව හා සංකේතිත සාක්ෂරතාව ද සැලකිල්ලට ගත යුතු ය. සංඥා හුදෙක් වාචික දෑට පමණක් සීමා නොවන අතර පංචේන්ද්‍රියන්ට අනුව සංඥාවන්හි ස්වරූපය වෙනස් වේ. සංඥාර්ථවේදය නවසිය හැටගණන්වල පමණ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. එය සංස්ථිතිකවාදය' හා සබැඳිණි. සාහිත්‍ය විචාරය හා චිත්‍රපට විචාරය සඳහා පමණක් නොව සෑම සංස්කෘතික නිෂ්පාදනයක් ම

---

© රොෂාන් ලක්නිල්

සංස්. පූජ්‍ය කැලලගමුවේ යමින්දින්න හිමි, උදිත ගයාෂාන් ගුණසේකර, ස්වර්ණා ඉහළගම, කෞෂල්‍ය පතිරණ

මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 13 කලාපය, 2010, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය